# සිංහලකම හා බෞද්ධකම වෙන්කිරීම

මහාවංසය ලියා ඇත්තේ මහානාම හිමියන් නමින් තමන්වහන්සේ හඳුන්වාගන්නා ලද භික්ෂුන් වහන්සේ නමක විසිනි. උන්වහන්සේ ඒ ලිවීමේ දී එවකට තිබූ වෙනත් පොත් හා ජනප්‍රවාද ඇසුරුකර ඇති බව මහාවංසයෙන් ම දැනගත හැකි ය. ඒ පොත්වලින් අද වන විට ඉතිරිව ඇත්තේ දීපවංසය පමණකි. එහෙත් අප කලින් දක්වා ඇති ආකාරයට මහානාම හිමියන් වෙනත් පොත්වලින් මෙන් ම ජනප්‍රවාදයෙන් ද කරුණු උකහාගෙන ඇත.

මහාවංසයේ ලියැවී ඇති කරුණු බොහෝමයක් ම අනෙක් සාධක සමග සංසන්දනයකිරීමේ දී නිවැරදි බව පෙනී ගොස් ඇත. එනම් වෙනත් බොහෝ කරුණුත් සමග මහාවංසය සංගත වෙයි. අප කිහිප වතාවක් ම කියා ඇති පරිදි ධර්මාශෝල රජතුමා හඳුනාගැනීමට හැකිවුයේ එතුමා ගැන මහාවංසයේ සඳහන් කරුණු හේතුවෙන් ය. එසේ නොවන්නට අද අසෝක ටැම්ලිපි යැයි හැඳින්වෙන ලිපිවල සඳහන් දෙවනපිය අසෝක ඉතිහාසයේ නොහඳුනාගත් චරිතයක් වීමට තිබූ ඉඩකඩ ඉතා වැඩි ය.

මහාවංස කතෘ මහානාම හිමියන් දක්ෂිණ භාරතීය භික්ෂුන් වහන්සේ නමක බවට මතයක් ඇතැම් පිරිසක් විසින් ඉදිරිපත්කරනු ලැබ ඇත. මෙවැනි මතයක් ඉදිරිපත්කිරීමේ දී ඒ යුක්තියුක්තකිරීමට (justify) හේතු සාධක ඉදිරිපත්කළ යුතු ය. එහෙත් මේ මතය ඉදිරිපත්කරන කණ්ඩායම එසේ කරන්නේ එවැනි කිසිවක් නො මැතිව ය. මේ අය ඇමරිකාවේ එක්තරා පුද්ගලයකු හෝ පුද්ගලයන් කිහිප දෙනකු විසින් මෙහෙයවන්නෝ වෙති. ඔවුන්ගේ අරමුණ මහාවංසයට ඇති පිළිගැනීම නැතිකිරීම ය.

ඔවුන් පළමුවෙන් කෙළේ අද සාමාන්‍යයෙන් පිළිගනු ලබන ඉතිහාසය කොඩ්රිංටන් නමැති ඉංගිරිසි ජාතික පරිපාලන නිලධාරියාගේ ඉතිහාසයක් යැයි කියමින් ඒ විවේචනයකිරීම ය. ඉංගිරිසි නිලධාරියකු විවේචනයකළ ද එහි වූයේ වෙනත් දෙයක් බැව් අපි කල්තබා ම දුටුවෙමු. කොඩ්රිංටන් විවේචනයකරමින් සිටි මේ පිරිස ඔහු ඒ ඉතිහාසය ලබාගෙන ඇත්තේ මූලික වශයෙන් ම මහාවංසයෙන් බව කීහ. ඒ අතර ඔවුන් කීවේ කොඩ්රිංටන් ඉතිහාසය යැයි ඔවුන් විසින් හඳුන්වනමු ලැබූ ඉතිහාසය විසින් සිංහලයන්ට ලංකාවේ සැබෑ ඉතිහාසය අහිමිකෙරෙන බව ය.

ඔවුන් කියා සිටියේ විජය රජු පැමිණීමට පෙර මෙරට ඉතිහාසයක් තිබූ බවත් එහෙත් කොඩ්රිංටන් ඉතිහාසය විසින් ඒ යටපත්කෙරී ඇති බවත් ය. මේ කොඩ්රිංටන් ඉතිහාසය යනු මහාවංස ඉතිහාසය (ඒ ඉතිහාස පොතක් නොවුණ ද එහි ඉතිහාසය ඇති බව අප සඳහන්කර ඇත.) බව දැනගැනීමට අටුවා ටීකා අවශ්‍ය නො වී ය. කොඩ්රිංටන් ඉතිහාසයෙන් සිංහලයන්ට අහිමිවන ඉතිහාසය දෙමළ ජනයා අත්පත් කරගෙන ඇති බව ද මේ ඇමරිකන් ඉතිහාසකාරයෝ සඳහන් කළහ. සිංහලයන් ලංකාවට ඒමට පෙර (එනම් විජය රජු ලංහාවට ඒමට පෙර) තිබූ ඉතිහාසයට දෙමළ ජනයා උරුමකම් කියමින් සිංහලයන්ට පෙර මෙරට දෙමළ ජනයා සිටි බවට මතයක් ලෝ පුරා සාර්ථක ව ගෙනයෑමට දෙමළ උගතුන්ට හැකි වී තිබෙන්නේ මේ කොඩ්රිංටන් ඉතිහාසය නිසා බව මේ නව ඉතිහාසඥයෝ කියා සිටියහ.

මේ හේතු නිසා විජය රජුට පෙර ඉතිහාසය නැවත ලියා ඒ ඉතිහාසය සිංහලයන්ට හිමිකර දිය යුතු බව ඔවුහු කියා සිටියහ. සිංහලයන්ට සාමාන්‍යයෙන් මේ මතය ආකර්ෂණීය විය. කොඩ්රිංටන් නම් ඉංගිරිසි පරිපාලන නිලධාරියා විවේචනයකිරීම සිංහලයන්ට ප්‍රශ්නයක් නො වී ය. ඒ අතර විජය රජුට පෙර ඉතිහාසයට උරුමකම් කීම ද සිංහලයන්ගේ සතුටට හේතු විය. එහෙත් සිංහලයන් නොදැන සිටි කරුණ වූයේ නව ඉතිහාසඥයන් විවේචනය කරන්නේ මහාවංසය බවත් ඔවුන්ගේ හා ඔවුන්ගේ ගුරුවරුන් හා අනුග්‍රාහකයන් වූ ඇමරිකානුවන්ගේ අභිප්‍රාය සිංහල ඉතිහාසයෙන් බෞද්ධකම මකා දැමීම බවත් ය. එමහින් සිංහල බෞද්ධ සංස්කෘතිය පරඬැලක් බවට පත්කිරීමේ අවශ්‍යතාව ද ඇමරිකානුවන්ට හා ඔවුන්ගේ නියෝජිතයන්ට විය.

මේ සමස්ත ව්‍යාපෘතිය ආරම්භ වූයේ අද ඊයේ නො වෙයි. එයට අවුරුදු විස්සකට වැඩි ඉතිහාසයක් ඇත. අපේ පැරණි වෙදකම, ගොවිකම, නීතිය ආදිය ගැන කතාකිරීමට මේ පිරිස එළඹී දැන් වසර විස්සකට වඩා වැඩි ය.

© Prof. Nalin De Silva

ඌරගේ මාළු උගේ පිටේ ම තබා කැපීමේ විධික්‍රමය අනුගමනයකරමින් ඔවුහු එහි දී භික්ෂූන් වහන්සේලා ද තම ව්‍යාපෘතියට සහභාගි කරගත්හ. අවුරුදු විස්සකට පෙර ඔවුන්ගේ ව්‍යාපෘතිය හඳුනාගැනීමට හැකි අයකු වී යැයි නො සිතමි. අද වුව ද බොහෝ දෙනාට ඒ හඳුනාගැනීමට නොහැකි වී ඇත්තේ මේ පුද්ගලයන් විවිධ බෞද්ධ කටයුතුවලට සහභාගිවන බෞද්ධ සමිති සමාගම්වල නිලතල දරණ පුද්ගලයන් වීම හේතුවෙනි. එවැනි උපාසකයන්ගෙන් බෞද්ධකමට අයහපතක් වන්නේ කෙසේ දැයි සිතන්නෝ වෙති.

එහෙත් කිසිම රහස් ව්‍යාපෘතියකට සදාකල් සැඟ වී සිටිය නො හැකි ය. ඔවුහු ක්‍රමයෙන් හෙළිදරව් වෙති. එයට ප්‍රධාන වශයෙන් හේතුවන්නේ ඔවුන්ගේ හදිසිය යි. මේ පිරිසෙන් එක්තරා තැනැත්තියක හෝ ගැහැණු නමකින් ලියන තැනැත්තකු හෝ පසුගිය දා මහාවංස කතෘ මහානාම හිමියන් හැඳින්වූයේ දකුණු ඉන්දීය භික්ෂූන් වහන්සේ නමක ලෙස ය. ඒ ලේඛිකාවට හෝ ලේඛකයාට අනුව අනුබුදු මිහිඳු හිමියෝ සිවුරක් පොරවා ගත් දෙමළ කොළු ගැටයකි. අශෝක රජු මිනිසුන් මැරූවෙකි.

දෙමළ ජනයා ගැන එසේ සඳහන්කළ ද, විජය රජුට පෙර ඉතිහාසය සිංහලයන්ට හිමිකිරීමට කතාකළ ද මේ අයගේ ව්‍යාපෘතියේ  අවසාන අරමුණ සිංහලයන්ට බෞද්ධකමත් පසුව සිංහලකමත් යන දෙකම නැතිකිරීම ය. යටකී ආකාරයෙන් මිහිඳු හිමියන් හැඳින්වීමෙන් ම මොවුන්ගේ බෞද්ධ විරෝධී බව ඉස්මතු වෙයි. මොවුන්ගේ ව්‍යාපෘතියෙහි තවත් අංගයක් වී ඇත්තේ මහාවිහාරය වෙනුවට අභයගිරිය ඔසොවා තැබීම ය. මහාවංසය මහාවිහාර භික්ෂූන් වහන්සේ නමකගේ කෘතියකි. මහානාම හිමියන් දකුණු ඉන්දීය භික්ෂූන් වහන්සේ නමක ලෙස හඳුන්වන මොවුහු යටා කාලයේ දී මහාවිහාරය ම දකුණු ඉන්දීය භික්ෂූන් වහන්සේලාගේ ආධිපත්‍යයට යටවුණු සිංහල විරෝධී ආයතනයක් යැයි කීමට කැසකවාගෙන සිටිති.

මේ වන විටත් ඒ අර්ථය දෙන නවකතා ලියැවී ඇත. ඊනියා ඓතිහාසික නවකතා නමින් තමන්ට කැමති ඉතිහාසයක් ඉතිහාසය පැත්තෙන් නැගෙන ප්‍රශ්නවලට මුහුණ නොදී ලියන පුද්ගලයෝ මහාවිහාරයට තම නවකතා හරහා පහර දෙති. මහාවිහාරය මෙරටට සතුරු ආයතනයක් ලෙස කටයුතුකර ඇති බව පෙන්වීම මේ සියල්ලන්ගේ ම අරමුණ වෙයි. මහාවිහාරයට පහර දෙන අතර ඇතැමෙක් අභයගිරිය දේශප්‍රේමී හා දේශජ ආයතනයක් ලෙස හඳුන්වාදෙති.

කලින් සඳහන්කරන ලද ඇමරිකන් ව්‍යාපෘතියේ ඉතිහාසඥයන්ට අනුව අභයගිරිවාසී භික්ෂූන් වහන්සේ විසින් ලියන ලද ඉතිහාස ග්‍රන්ථයක් වෙයි. එහි නම උත්තරමූල මහාවංසය යැයි කියනු ලැබෙයි. එහෙත් අවාසනාවකට උත්තරමූල මහාවංසයෙහි පිටපත් අද සොයාගැනීමට නොහැකි බවත්, එහි කලෙකට පෙර තිබූ එක්තරා පිටපතක එක් පත්තිරුවක් පමණක් තමා දැක ඇති බවත් මේ නව ඉතිහාසඥයෙක් පවසයි. මෙවැනි ග්‍රන්ථයක් වේ නම් ඒ දැකගැනීමට අපි දු කැමති වෙමු. එහෙත් දැනට නැතැයි කියන ග්‍රන්ථයක මේ මේ කරුණු තිබෙන්නට ඇතැයි කියමින් මහාවංසයට එරෙහිව ඒ දෑ ඉදිරිපත්කිරීම කිසිම ශාස්ත්‍රීය ශික්ෂණයක ක්‍රමවේදයක් නො වෙයි.

මනාවංසයෙහි ඇති දුර්වලතා ගැන අප කලින් සඳහන්කර ඇත. එහෙත් අප තේරුම්ගත යුතුව ඇත්තේ එසේ වීමට ද හේතු ඇති බව ය. මේ හේතුවලින් සමහරක් අපි දැනටමත් සාලච්ඡාකර ඇත්තෙමු. ආන්ද්‍ර ප්‍රදේශයෙන් ථෙරවාදය නැතිවී යෑමේ තර්ජනයට මුහුණ දුන් ආන්ද්‍ර හා සිංහල භික්ෂූන් වහන්සේ බුදුදහම පාළි භාෂාවට පරිවර්තනයකිරීමට තීරණයකිරීමත් බුදුදහම ආරක්ෂාකිරීම සිංහල බෞද්ධයන්ගේ කාර්යභාරය ලෙස සැලකීම ආරම්භකිරීමත් සමග සිංහල බෞද්ධ රාජ්‍යය තහවුරුකිරීමේ වැදගත්කම සිංහලයන්ට අවබෝධ විය. මේ වන විට ජනප්‍රවාද ගෙතී තිබෙන්නට ඇත්තේත් ඒ වෙනුවෙන් යැයි සිතාගැනීමට හැකි ය.

මේ සියල්ලෙහි ප්‍රතිඵලය වී ඇත්තේ සිංහල බෞද්ධ රාජ්‍යයෙහි සිංහලකම හා බෞද්ධකම එකට බැඳ තබන කරුණුවලට වැදගත් තැනක් හිමිවීම ය. බුදුන් වහන්සේ පිරිනිවන් පෑ දිනයෙහි ම විජය රජු ලංකාවට ගොඩ බැස්සවීම මේ හා සම්බන්ධ එක් ප්‍රධාන සිද්ධියක් වී ඇති බව පෙනෙයි. සිංහල ජාතියේ ආරම්භය විජය රජුට පවරා ජාතියේ ආරම්භය යැයි සැලකෙන දිනය විජය රජුගේ සම්ප්‍රාප්තියට සම්බන්ධකිරීම ඔස්සේ සිංහල බෞද්ධ රාජ්‍යය තහවුරුකිරීමේ වෑයමක් අපට එකල වූ ජනප්‍රවාද මගින් කෙරුණු බව සිතාගත හැකි ය.

© Prof. Nalin De Silva

දිපවංසය ලියු කාලයේ ද මේ ජනප්‍රවාද තිබී ඇති මුත් ඒ වඩාත් තහවුරු වී ඇත්තේ දීපවංසය හා මහාවංසය ලියු කාල පරිච්ඡෙද අතර බව පැහැදිලි ය. ඒ ග්‍රන්ථ දෙකෙහි ආකල්ප, තේමාවන් හා ආකෘති අධ්‍යයන කළවිට ඒ බව තේරුම්ගත හැකි ය. කෙසේ වෙතත් මේ හේතුවෙන් යම් යම් පරස්පර දීපවංසයට හා මහාවංසයට රිංගා ඇත. රජවරුන්ගේ රාජ්‍යකාල ප්‍රශ්නය එහි දී ප්‍රධාන වෙයි. විජය රජුගේ සිට ගැමුණු රජු දක්වා රාජ්‍ය කාල නිර්ණයකිරීමේ දී පණ්ඩුකාභය රජු මහළුවන තෙක් රජ කමේ තබාගැනීමත් එතුමාට අවුරුදු හැත්තෑවක රාජ්‍ය කාලයක් ලබාදීමත් ඒ අතර කැපී පෙනෙන කරුණු වෙයි.

අපේ වංසකතාවල ඇති මේ අඩුපාඩු අප නැතිකර ගත යුතු ය. එසේ කිරීමේදී අප අපේ සියල්ල නැතිකරගත යුතු නො වි. එසේ ම අප ඇමරිකන් ඉතිහාසඥයන්ගේ අවශ්‍යතාවන් අනුව කටයුතු කළයුතු නො වෙයි. මේ රාජ්‍යකාල ප්‍රශ්නය ඉතා පහසුවෙන් විසඳාගත හැක්කකි. එය ශිරාන් දැරණියගල මහතාගේ පර්යේෂණවලින් දැනටමත් විසඳී ඇත. මෙරටට අර්ධ වෛදිකයන් පැමිණ ඇත්තේ විජය රජු පැමිණියා යැයි කියන කාලයට අඩුම තරමින් අවුරුදු තුන්සීයකට පෙර බව දැන් හෙළි වී ඇත.

අප ප්‍රවාද නිර්මාණය කළ යුත්තේ ශිරාන් දැරණියගල මහතාගේ පර්යේෂණ හා පණ්ඩුකාභය රජතුමා අතර කාලයෙහි ඇති පරස්පර අවමයක් වන ආකාරයට ය. අපේ ප්‍රවාදවල පණ්ඩුකාභය රජතුමා සිංහලේ පළමු රජතුමා ලෙස සලකන්නේ මේ කරුණුත් එවකට ඇති වී තිබෙන යක්ෂ හා අර්ධ වෛදික සමගියත් සැලකිල්ලට ගනිමිනි. එහි දී පණ්ඩුකාභය රජු සිංහලේ පළමු රජතුමා බවට පිළිගැනී ඇති සම්ප්‍රදාය ද අපට බෙහෙවින් උපකාර විය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva